# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1625 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 23/10/2024 පැය 1935

## මාධ්‍ය නිවේදනය

**හෙරොයින් ජාවාරම් කිරීම, සන්තකයේ තබාගැනීම හා ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකරුවන් 10 දෙනෙකුට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම කිරීම - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.**

2016.04.01 වන දින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය හා නාවික හමුදා නිලධාරීන් එකාබද්ධව ශ්‍රී ලංකා මුහුදු තීරයේදී හෙරොයින් කිලෝග්‍රෑම් 111 ග්‍රෑම් 82 ක් ජාවාරම් කිරීම, සන්තකයේ තබාගැනීම හා ඊට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් ඉරාන ජාතිකයින් 10 දෙනෙකු, පකිස්ථාන ජාතිකයින් 02 දෙනෙකු, ඉන්දීය ජාතිකයෙකු, සිංගප්පූරු ජාතිකයෙකු හා ශ්‍රී ලාංකිකයින් තිදෙනෙකු ලෙස සැකකරුවන් 17 දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණි.

මෙම සැකකරුවන් 17 දෙනා සම්බන්ධයෙන් නීතිපති තුමාගේ උපදෙස් මත මීගමුව ගරු මහාධිකරණයේ චෝදනා 19 යටතේ අධිචෝදනා ගොනු කර තිබූ අතර එම නඩුව 2024.10.23 වන අද දින මීගමුව ගරු මහාධිකරණයේ කැඳවූ අවස්ථාවේදී එම සැකකරුවන් අතර සිටි ඉරාන ජාතික සැකකරුවන් 10 දෙනා වරද පිළිගැනීමෙන් අනතුරුව ගරු විනිසුරුතුමා විසින් ඔවුනට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කර ඇත. අනෙක් සැකකරුවන් සඳහා මෙම නඩුව 2024.11.04 වන දින නැවත විභාගයට ගැනීමට නියමිතව ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**